www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද සහ ඕස්ට්‍රේලියානු මැතිවරනවල දේශපාලන පාඩම්

## Political lessons of the US and Australian elections

**නික් බීම්ස් විසිනි**

**2004 දෙසැම්බර් 10**

ඕස්ට්‍රේලියානු මහා මැතිවරනයේ හා එක්සත් ජනපද ජනාධිපතිවරනයේ ප්‍රතිඵල සැලකිල්ලට ගන්නා විට දේශපාලන ක්‍රමයන් දෙක අතර වැදගත් වෙනස්කම් තිබියදී ම සමාන ලක්ෂන ගනනාවක් කෙනෙකුට දැකගත හැකිවේ. දෙරටෙහි ම මැතිවරන ප්‍රතිඵලය පිලිගෙන ඇත්තේ කෙසේ නම් එය සිදුවී ද යන ප්‍රශ්නය ද සමග ය.

මිලියන ගනානවක් ජනතාවට ප්‍රතිඵලය සැබවින් ම තැති ගන්නාසුලු එකකි. බේගල් මාලාවක් ද විකෘතිකරනයන් ද මත පදනම් වූ නීතිවිරෝධී යුද්ධයක් දියත් කල ද, බුෂ් මෙන් ම හොවාඩ් ද යලි බලයට පත්වූහ. ඔවුන් යලි පත්වූවා පමනක් නො ව වැඩි බහුතරයක් ද ලබාගත්හ. තැතිගැන්ම හුදෙක් ඔවුන් යලි බලයට ඒම පිලිබඳව පමනක් නො වේ. අවශ්‍ය නිවැරදි කිරීම් ඇති කිරීමට දේශපාලන ක්‍රියාවලිය අසමත්ව ඇති බව සනාථ කර තිබීම පිලිබඳ ගැඹුරු කනස්සල්ලක් ද ඉන් ප්‍රකාශිත ය. 2003 පෙබරවාරියේ දී ලොව වටා දශලක්ෂ සංඛ්‍යාවක් ඉරාක යුද්ධයට එරෙහිව පෙලපාලි - ඉතිහාසයේ දැවැන්තම පෙලපාලි - දක්වීමෙන් පසුව ද ඔවුන්ගේ විරෝධතාවන් සිය ආන්ඩු කෙරෙහි බලපෑමක් ඇති නො කල බව ද, සැලසුම් කල පරිදි යුද්ධය පෙරට ගමන් කල බව ද, අත්දුටු පරිදිම මෙය ද, යම් ආකාරයකින් වඩා ඉහල තලයක දී පුනර්කරනය වීමක් පමනක් විය.

මැතිවරනයට ප්‍රථමයෙන් බුෂ්ගේ හා හොවාඩ්ගේ ආන්ඩු දෙකම අවජාතක ඒවා බවට හැඟීමක් පැතිර පැවතුනි. එක්සත් ජනපදයේ 2000 වසරේ මැතිවරනය බොහෝ දෙනෙක් සලකනු ලැබුවේ අනාගතයේ දී මැතිවරන ක්‍රියාවලිය මගින් ම නිවැරදි කරනු ඇති අහඹුවක් හා මුලාවක් ලෙස ය. බුෂ් 2000 දී ඡන්ද සංඛ්‍යාවෙන් ජය නො ගත් අතර ෆ්ලොරිඩා හි ඡන්ද නිවැරදිව ගනන් කරනු ලැබුවේ නම් මැතිවරන කොලීජියේ ඡන්දයෙන් ඔහුට ජය නො ගත හැකිව තිබුනි. ඔහු තෝරා පත් කර නො ගත් අතර ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතිය බලයෙන් පැහැරගත් ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුවක් මත තෝරාගනු ලැබුනි.

එතරම්ම බලගතු නො වූව ද, හොවාඩ් ආන්ඩුව 2001 යලි බලයට පත්වීම සම්බන්ධයෙන් ද මැතිවරනයට පූර්වයෙන් ඊට සමාන වූ හැඟීමක් පැවතුනි. මත විමසුම්වල දී පසුපසින් ඇදී යමින් සිටි හොවාඩ් අමාරුවේ වැටී සිටියේ ය. අගෝස්තුවේ දී ඕස්ට්‍රේලියානු මුහුදු සීමාවට ඇතුල්ව සිටිය දී බේරාගත් ටැම්පාහි සරනාගතයන්ගෙන් පිරී ගිය බෝට්ටුවෙන් ලමයින් ඉවතට වීසි කරන බවට පලවූ මුසාවාදයන්ගේ පිහිට ලබමින් හොවාඩ්, සරනාගතයන්ට එරෙහි දුෂ්ඨ ව්‍යාපාරයක් ඇවිලවී ය. ''දේශසීමා ආරක්ෂාව'' පිලිබඳ භීතිය වැපිරවීම මගින් යන්තම් දෙමසකට පසුව සැප්තැම්බර් 11 සිද්ධීන්ගෙන් දිරිගන්වනු ලැබූ ඔහුට ජයගැනීමට හැකි විය. 2004 මැතිවරනයේ දී 2001 දී සිදු වූ අසාධාරනය නිවැරදි කරනු ඇතැයි බොහෝ දෙනෙක් කල්පනා කලහ. එහෙත් සිදුවූයේ හොවාඩ් සිය ඡන්ද වැඩි කර ගැනීම යි.

මෙම ප්‍රතිඵලයන් විස්තර කල හැක්කේ කෙසේ ද? දක්ෂිනාංශික ඕස්ට්‍රේලියානු මාධ්‍යකරුවන්ට මේ සඳහා සූදානම් කල පිලිතුරක් විය. එනම් ඉරාක යුද්ධය ගැන වූ හොවාඩ් විරෝධය හරිතමය උපනගරයන්හි වෛද්‍යවරුන්ගේ භාර්යාවන් වැනි ''සංස්කෘතික වංශවතුන්ට'' සීමා වූ අතර ''සාමාන්‍ය ඕස්ට්‍රේලියානුවන්'' ආන්ඩු මාරුවක ආර්ථික ප්‍රතිවිපාකයන් ගැන බියපත් වූයේ හොවාඩ්ගේ සංස්ථීතිකවාදයට වඩා ලැදිකමක් දක්වූහ. ඡන්දදායකයන් පැසසීම වෙනුවට ඔවුන් හෙලාදැකීම හැරෙන්නට අනෙක් පාර්ශ්වයේ දෘෂ්ටිය අවශ්‍යයෙන් ම නොවෙනස් ය. සිඩ්නි මෝනින් හෙරල්ඩ් පුවත් පතේ ඇලන් රම්සේට අනුව මෙම තත්වය ''සුලු ජනතාව ගසාකෑමේ මුග්ධත්වයෙහි'' ප්‍රතිඵලයයි.

බුෂ් යලි බලයට ඒම පිලිබඳව එක්සත් ජනපද ''වාමාංශයේ'' ප්‍රතික්‍රියාවන් ද මීට සමාන ය. මැතිවරනයෙන් තෙදිනකට පසුව නේෂන් යන ලිබරල් වාම සඟරාවේ තීරු රචිකාවක වන කථා පොලිට් ''වැලපීම'' නම් ලිපියක දී කෙරී සම්බන්ධව ''ගතුකීම හා විවේචන'' ඇසීම ප්‍රතික්ෂේප කල අතර ඔහු ''ඉතා හොඳ අපේක්ෂකයෙකු'' වූ බව අවධාරනය කලා ය.

දෝෂය පැවරිය යුත්තේ ජනතාවට ය. මේ අවස්ථාවේ දී ''ඡන්දදායකයන් ඔවුන්ට සැබවින් ම අවශ්‍ය දේ තෝරා ගත්හ. එනම් ජාතිකවාදය, පූර්වභංග යුද්ධය, නීතිය නොව පිලිවෙල, 'වධදීම් මගින් ආරක්ෂාව' සමලිංගිකයන්ට හා කාන්තාවන්ට එරෙහිව ආපසු හැරීම, ඇත්තන් හා නැත්තන් අතර ආගාධය, ඔවුන්ගේ පල්ලිවලට ආන්ඩුවේ පරිත්‍යාග හා හිතුවක්කාරී හෝ මං පහරන ජනාධිපති'' යනාදිය බව ඇය දැඩි ලෙස කියා සිටියා ය.

එක්සත් ජනපද මැතිවරනය අවසන් වූ වහාම පැවැත් වූ මත විමසුම් අනාවරනය කලේ ඊනියා ''වටිනාකම්'' ඡන්දදායකයන්ගේ අභිලාෂයන් තීරනය කිරීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කල බව යි. පසුගිය වසර විසිහතක් හෝ ඊට වැඩි කාලයක් තිස්සේ රිපබ්ලිකන් පක්ෂය ඡන්දදායකයන් අතර ආධිපත්‍ය දැරීම හා බුෂ්ගේ ජයග්‍රහනය පැහැදිලි කිරීමේ දී ආගමික මූලධර්මවාදයේ ක්‍රියාකලාපය වෙතට අවධානය යොමුව තිබේ.

''ඇමරිකාවට සිදුව ඇත්තේ කුමක්ද?'' යන තෝමස් ෆ්‍රැන්ක් ගේ මෑත කෘතියක දී අද දවසේ දේශපාලන ප්‍රහේලිකාව විමසුමට ලක්කරයි. ඇමරිකානු සමාජයේ දුගීම හා වඩාත්ම පීඩිත කොටස් අඛන්ඩව හා වැඩි වැඩියෙන් සිය ඡන්දය රිපබ්ලිකන් පක්ෂයට ලබා දී ඇති බව නිසැක කරුනකි. සිය උපන් බිම වන කැන්සාස් ප්‍රාන්තයේ සිදු කල කරුනු විමසීමක දී, නිදහස් වෙලඳ පොල ක්‍රියාමාර්ග තුලින් පැනනගින ආර්ථික ව්‍යසනය විසින්, කෝපය ඉච්ඡාභංගත්වය හා පරත්වාරෝපනය ''ලිබරල් වංශවතුන්'' කෙරෙහි සතුරුකමක් බවට පත්වී ඇත්තේ කෙසේ දැයි ෆ්‍රැන්ක් පැහැදිලි කරයි. පහලම ඒකජනක ආදායමක් ද මධ්‍යම නිවාස වටිනාකම්හි පහලම අගයන් ද සහිත ප්‍රදේශවලින් බොහෝ සංස්ථිතික දේශපාලනඥයන්ට ප්‍රබලම සහයෝගය අඛන්ඩව වාර්තා විය. සමාජ පන්තිවල භූගෝලය උඩු යටිකුරු වී තිබේ.

''මෙම සමස්ත ඇමරිකානු දුෂ්කෘත්‍යය ගැන අපි සලකා බලමු.'' ඔහු ලියයි. ''රාජ්‍ය නිර්බාධවාදය, පුද්ගලීකරනය හා සීමා ඉවත් කිරීමේ රේගන්-බුෂ් කුලප්පුව විසින් රාජ්‍යයක නො සලකා හැරීම විදහා පායි. රාජ්‍යය එහි ගම්බද ප්‍රදේශ ජනශූන්‍ය වීම ද, නගර කැඩීබිඳී යාම ද, මහා නගර එකතැන පල්වීම ද ධනවතුන්ගේ වාසස්ථාන ඒවායේ දුරස්ථ පාලක මගින් ක්‍රියාත්මක කෙරෙන ආරක්ෂක ගේට්ටු පිටුපසින් බබලන ආකාරය ද දැකගනියි. රාජ්‍යය කැරලි ගසා නැගී සිටියි. එහෙත් කැරලිකරුවන් ඉල්ලා සිටින්නේ කුමක් ද? ආරම්භයේ දී ම තමන්ට ද තම අසල්වැසියන්ට ද වින කැටි ඉහත පියවරයන් ම ය. මෙය කැන්සාස්වල ම අභිරහසක් නො වේ. මේ සියල්ලෙහි විභවය සකසා ඇති ඓතිහාසික මාරුව ඇමරිකාවේම අභිරහසයි. (*Whats's the matter with Amirica? [ඇමරිකාවට සිදුවී ඇත්තේ කුමක් ද?]* පිටු 76)

රිපබ්ලිකානුවන්ට සිය පදනම මෙහෙයවීමට හැකියාව ලබාදුන් ආගමික මූලධර්මවාදයේ නැගීමත් ගබ්සාව, සමලිංගික විවාහ හා ගිනිඅවි පාලනය වැනි කාරනා ඔවුන්ගේ සාර්ථකත්වයේ වැදගත් කොටසක් ඉටු කල බව සහතික ය. එහෙත් මෙය ඔවුන්ගේ ජයග්‍රහනය පැහැදිලි කරන විමසුමක් නො වේ. එම ප්‍රවිෂ්ටය සැලකිල්ලට ගත්විට නිශ්චිත ප්‍රශ්න මතුවේ. ඒවායේ සමාජ ආර්ථික මූලයන් කවරේ ද? ආර්ථික අනාරක්ෂිතභාවය, අසමානතාවය සමාජ ආතතීන් හා ආගමික මනෝභාවයන් වැඩියාම ''ලිබරල්'' වටිනාකම් ලෙස මේතාක් දුටු දේට එරෙහිව සංස්කෘතිකමය හැරීමක රූපය ගෙන ඇත්තේ කුමක් නිසා ද? ආගමේ බලය පිලිබඳ මවාපෑමෙහි මූලාශ්‍රය කවරේ ද? එයට අභියෝග කල නොහැකි වූයේ මන්ද? වෙනත් වචනවලින් කිවහොත් රිපබ්ලිකානුවන්ගේ ජයග්‍රහනය සරලවම ආගමික මනෝභාවයට ද එයට මෙහෙයවීමට ඔවුන්ට හැකිවීම කෙරෙහි ද ආරෝපනය කිරීම බුෂ්ගේ මැතිවරන ජයග්‍රහනය පැහැදිලි කරන්නක් නොව හුදෙක් ඒ පිලිබඳ තවත් විස්තරයක් පමනකි.

ඕස්ට්‍රේලියානු මැතිවරනයේ දී සිද්ධීන් වෙනස් රූපයක් ගනු ලැබුව ද, සමාන ප්‍රශ්න මතුවෙයි. උකස්කරයන් ගෙවන්නා වූ කුටුම්භයන්ගේ ඉහල ප්‍රතිශතයක් සහිත උප නාගරික ප්‍රදේශවල දී ලිබරල්වාදීන්ට වැඩි ඡන්ද ප්‍රමානයක් හිමි විය. උකස්කරුවන්ගේ ප්‍රතිශතය විශාලවත්ම ලිබරල්වාදීන් වෙත හැරීම ද ඉහල නැගුනි. ලිබරල්වාදීන් සිය මැතිවරන උපායන්, බියගැන්වීමේ ව්‍යාපාරයක් මත පදනම් කලහ. ලේබර් පක්ෂයට ඡන්දය දීමෙහි අර්ථය වැඩි පොලී අනුපාතිකය යි කියමින් ලිබරලුන්ගේ ආර්ථික සෞභාග්‍ය ගෙනඒමේ අතීත වාර්තාව වර්නනා කරන අතරම මිලියන ගනනක් ජනතාවගේ ජීවිත මත ආධිපත්‍ය දරන ආර්ථික අනාරක්ෂිතභාවය හොවාඩ්ගේ මැතිවරන ව්‍යාපාරය විසින් ගසාකනු ලැබී ය.

භීතියේ මූලාශ්‍රය නයගැතිකමේ ගනන්හිලව් තුල දැකගත හැකිවිය. 2002 දක්වා පස්වසර තුල නිවාස නය සියයට 15.4කින් ඉහල ගිය අතර 2003 දී එය සියයට 20කටත් වඩා ඉහල නැගුනි. 1993 දී කුටුම්භ නයගැතිකම මුලු ආදායමෙන් සියයට 56ක් විය. එය 2003 වන විට සියයට 125ක් දක්වා දෙගුනයකින් ඉහල ගියේ ය. 1980 ගනන් අගභාගයේ දී සියයට 17ක් හෝ ඊටත් වඩා වැඩි වූ පොලී අනුපාතිකය ඉන්පසු සැලකිය යුතු තරමින් පහල වැටුනි. එහෙත් නිවාස මිල පිම්බී යාමේ බුබුල නිසා නිවාස ගැනුම්කරුවන් වෙන කවරදාකටත් වඩා නයෙහි ගිලී ඇති අතර පොලී අනුපාතිකයේ සුලු ඉහල නැගීමකට පවා අතිශයින්ම

සංවේදී ය.

පිටත උපනගරවල බොහෝ කම්කරු පන්තික පවුල් මුහුන දී සිටින අඩමාන තත්වය නිශ්චිතවම ලිබරලුන්ගේ බිය ගැන්වීමේ ව්‍යාපාරයට ද්‍රව්‍යමය කොන්දේසි සකසා ඇත. එහෙත් මෙම බිය හා අවිනිශ්චිතභාවය හොවාඩ් ආන්ඩුවට ඡන්දය දීම බවට පරිවර්තනය වූයේ ඇයි ද යන්න ඉන් පැහැදිලි නො කරයි. එයට වෙනස් ලෙස කම්කරු ජනතාව එක රැයකින්ම වාගේ බංකොලොත් කල හැකි කොන්දේසි නිර්මානය කල හොවාඩ් ආන්ඩුවේ ප්‍රතිපත්තිවලට එරෙහිව දැවැන්ත ඡන්ද ප්‍රතිපලය බවට එය පත්විය හැකිව තිබුනි.

## කම්කරු හා ඩිමොක්‍රටික් පක්ෂවල ප්‍රතිපත්ති

වෙනත් වචනවලින් කිවහොත් එක්සත් ජනපද හා ඕස්ට්‍රේලියානු මැතිවරන ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමේ දී මැතිවරන ව්‍යාපාරය අතරතුර ද, දිගුකාලීනව ද, ජනගහනයේ පුලුල් කොටස්වල දේශපාලනික සවිඥානකත්වය ද, අවබෝධය ද හැඩගැන් වූ ඩිමොක්‍රටික් හා ලේබර් පක්ෂ ප්‍රතිපත්තීන්ගේ ඓතිහාසික ක්‍රියාවලිය අප විසින් විභාග කල යුතු ය.

ඇමරිකානු ජනතාව පොරබදන ගැටලු විසඳීම කෙසේ වෙතත් ඒ ගැන සාකච්ඡාවක් ඇරඹීමේ ප්‍රතිපත්තියක් හෝ මැතිවරන ව්‍යාපාරය තුල ඩිමොක්‍රටිකයන් විසින් ඉදිරිපත් නොකලහ. රිපබ්ලිකානුවන් කෙරීට පහර ගැසුවේ ඔහු සෙවල අපේක්ෂකයෙක් ලෙස හඳුන්වමිනි. ඩිමොක්‍රටික් පක්ෂය තුල අවශ්‍යයෙන්ම පැවතියා වූ විසම්මුතීන් නිසා එයට නින්නාදයක් හිමි විය. එය සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන්ට ආයාචනා කිරීමට උත්සාහ දරන අතරතුර අන් සියල්ලට ම ඉහලින් ව්‍යාපාරික ඇමරිකාවේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමට කැප වූ ධනපති පක්ෂයකි. ඉරාක යුද්දය කෙරේ කෙරී කල විවේචන තිබියදීම යුද්ධය සඳහා දක්වූ හේතුසාධකයන්ගේ ව්‍යාජත්වය හෙලිවීමෙන් පසුව පවා ඔහු බුෂ්ට යුද බලතල පවරමින් තමන් දුන් ඡන්දය වෙනස් නොකරන බව අවධාරනය කලේ ය. ඔහු ''ත්‍රස්තවාදයට එරෙහි යුද්දයට'' එකඟත්වය පල කරන අතර එයට ගෙවීමට අරමුදල් ගොඩනැගීම සඳහා කැපවී සිටියි. එහෙත් සමාජ වැඩපිලිවෙලට මුදල් යෙදවිය යුත්තේ ''වැයකල හැකි සීමාව'' යන පදනම මත ය.

රිපබ්ලිකානුවන්ගේ මැතිවරන මූලෝපාය සැදුම්ලන්නේ ඔවුන්ගේ ඡන්ද පදනම මෙහෙයවීම මත, එනම් ''වටිනාකම්'' වලට කරන ඇමතීම්වලට ප්‍රතිචාර දක්වන්නා වූ ජනගහනයෙන් විශාල කොටස් බලමුලුගැන්වීම මත ය. එහෙත් එවන් පදනමක් ඇති වූයේ කෙසේද? මෙහි දී 20 වැනි සියවසෙහි අවසන් දශකයන්හි අත්දැකීම් විභාග කිරීම අවශ්‍ය ය.

මෙම අවධියෙහි අතිශයින්ම වැදගත් ලක්ෂනය වූයේ එවකට පැවති කම්කරු ව්‍යාපාරයේ පරිපූර්න බිඳවැටීම යි. මෙහි අර්ථය වූයේ දශලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ට පන්තියක් ලෙසින් සිය සමාජ හා දේශපාලන ගැටලු පොරබැදීමටත්, සිය අයිතීන් ආරක්ෂා කර ගැනීමටත් සංවිධානයක් නොමැතිවීම යි. සිය ජීවිතයේ වැඩී යන දුෂ්කරතාවෙන් නිර්මිත සමාජ ආතීන් හමුවේ කිසිඳු ප්‍රගතිශීලී පිටවීමේ මගක් සොයාගත නොහැකිවීමෙන් දක්ෂිනාංශික ගුවන්විදුලි හා රූපවාහිනි පන්ඩිතයන්ගේ කටුක විවේචනයන්ගේ ද එවැන්ජලිකයන්ගේ ද ග්‍රහනයට ඔවුන් හසුවිය.

එක්සත් ජනපද මැතිවරන ගැන *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් ඉදිරිපත් කල වාර්තාව තුල තත්වය ඔහු මෙසේ කැටිකොට දක්වී ය.

''රැකියා අහිමිව, පරම්පරා ගනනාවක අරගලවලින් පෝෂනය කල පන්ති සවිඥානකත්වයකින් යුත් ගැඹුරට මුල් බැසගත් සමාජ සම්බන්ධතාවලින් කපා හල, ඔවුන් අතරමංකල වෘත්තීය සමිතිවලින් හුදෙකලා වී ගිය ඊයේ සටන්කාමී කම්කරුවන්, හැමවිටම අලුත් ගනුදෙනුකරුවන් සොයමින් සිටින එවැන්ජලික කර්මාන්තයෙහි හොඳින් පුහුනු කල අවනත වූ වන්දි භට්ටයන් බවට පත්වූහ. සංවිධානය වූ කම්කරු ව්‍යාපාරයක පරිසරයෙන් මුලුමනින්ම වියෝවී හැදී වැඩුනු හා පන්ති අරගලයේ සම්ප්‍රදායන් පිලිබඳ දැනුවත්කමෙන් අඩු හෝ කිසිසේත්ම නොමැති එවන් කම්කරුවන්ගේ දරුවන් සම්බන්ධයෙන් නම් පන්ති සවිඥානකත්වයේ වර්ධනයට බාධාවන් බොහෝ ය. මෙම ලෝකය තුල හා ඔවුන්ගේ ජීවිත කාලය තුල වඩාත් හොඳ හා මිනිස්කම් සහිත සමාජයක් පිලිබඳ හැඟීම පසෙක තැබුවත් සමකාලීන සමාජය පිලිබඳව විවේචනාත්මක ආකල්පයක් වැඩී ඒමට පහසුවන තොරතුරු හා අභ්‍යන්තර ඥානයක් අත්කරගත හැක්කේ කුමන මූලාශ්‍රයකින් ද? සහතිකෙන්ම පවත්නා වූ දේශපාලන පක්ෂවලින් හෝ ජනසන්නිවේදන මාධ්‍යවල නරාවලෙන් නම් නො වේ.''

ඕස්ට්‍රේලියාවේ දී හොවාඩ්ගේ ජයග්‍රහනය හමුවේ ලේබර් පක්ෂයේ ඡන්ද ප්‍රමානය ඓතිහාසික පහල මට්ටමක් වූ සියයට 38කට ඇද වැටුනි. මෙම ප්‍රතිඵලය එක්වරකට පමනක් සීමා වූ මුලාවක් නො ව පසුගිය 15 වසර පුරා වැඩී ආ ප්‍රවනතාවයක් පෙරට යාමකි. ෆ්‍රේසර් යටතේ ලිබරලුන් ලත් පරාජයත් සමග හෝක් ආන්ඩුව බලයට පත් වූ තැන් පටන් දැන් විසි වසරකටත් වැඩි කලක් ගතව ඇත. මෙම මැතිවරන ජයග්‍රහනය 1930 ගනන්වලින් පසුව ඇති වූ ගැඹුරුතම අවපාතයට ප්‍රතිචාර වශයෙන් කම්කරු පන්තිය තුලින් පැනනැගි

දේශපාලන ව්‍යාපාරයක ප්‍රතිඵලය විය. 1983 මුල දී මැතිවරනය ප්‍රකාශයට පත්කල විට බොහෝ අංශවලින් ප්‍රතිඵලය පූර්වයෙන් නිගමනය වී තිබුනි. ලේබර් පක්ෂය දෙකට එකක් තරම් වූ ඡන්දයකින් ප්‍රාථමික වටයේ දී ජයගත්තේ ය. එහෙත් දැන් එහි ඡන්ද සංඛ්‍යාව තුනෙන් එකකට වඩා මඳක් වැඩි වන අතර එම මට්ටම 1993 පටන් ඉදිරියට පැවතීගෙන එයි.

මෙම ඓතිහාසික පරිහානියට හේතුව 1980 ගනන් අගභාගයේ ප්‍රථමයෙන් ම පැහැදිලිව දැකගත හැකිවිය. හෝක් කීටිං කම්කරු ආන්ඩුව වෘත්තීය සමිති නිලධරය සමග එක්ව ධනය විශාල ලෙස ශ්‍රමය වෙතින් ප්‍රාග්ධනය කරා යලි බෙදාහැරීම ද නියාමන කටයුතු අවසන් කිරීම ද මගින් නිදහස් වෙලඳ පොල සඳහා කොන්දේසි නිර්මානය කිරීමට දැරූ උත්සාහය කම්කරු පන්තියේ සමාජ තත්වයට ද සමාජ කොන්දේසිවලට ද එරෙහිව නිමක් නැති ප්‍රහාරයකට මුලපිරීමක් විය. මෙය වැලැක්වීමේ කිසිදු ක්‍රියාවකට ඉඩක් නො ලැබුනි. වෘත්තීය සමිති නිලධරය අධිකරනය ද පොලිසිය ද සමග එක්ව ඉදිකිරීම් කම්කරුවන්ගේ සම්මේලනය කුඩු කර දැමූහ. නව පිලිවෙලට විරුද්ධවීමේ හේතුව මත ලෝහ කම්කරු නියෝජිතයන් රැකියාවලින් පහකලහ. ක්වීන්ස්ලන්තයේ විදුලිබල කම්කරුවන් හුදෙකලා කලහ. මිලිටරිය යොදාගනිමින් ගුවන් නියමුවන්ගේ වැඩවර්ජනය පරාජය කලහ. කිසිදු ලෙසකින් ප්‍රගතිශීලි සමාජ ඉදිරිදර්ශනයක් සම්පාදනය කිරීමට සමත් බලයක් ලෙස ලේබර් පක්ෂය හා වෘත්තීය සමිති ව්‍යාපාරය නොපැවතීමේ තත්වය තුල කම්කරු පන්තියේ විශාල කොටස් හොවාඩ්ගේ ව්‍යාපාරය විසින් ඒ තුලට ඇදගෙන තිබීම පුදුමයට කාරනයක් නොවීය. සමාජ ප්‍රතිසංස්කරනයේ පැරනි ක්‍රියාමාර්ග මුලුමනින්ම බිඳවැටී තිබේ.

එක්සත් ජනපදයේ දී මෙන්ම ඕස්ට්‍රේලියාවේදීත් ඩිමොක්‍රටික් හා ලේබර් පක්ෂ සිය පරාජය පිලිබඳව සමාන වූ නිගමනවලට එලඹ සිටිති. ඩිමොක්‍රටිකයන් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගවලට වඩා සංස්කෘතිය හා ගතිලක්ෂන හරිමැදට ගෙන ආ යුතු බව තීරනය කර තිබේ. ඇමරිකානු දේශපාලන ජීවිතයේ දී මුග්ධ ආගමික අගතීන් ඒ සා අදිකාරවත් ක්‍රියාකලාපයක් ඉටු කලේ මන්ද යන්න විභාග කිරීමට කිසිවක් කර නැත.

ලේබර් පක්ෂයේ පශ්චාත් මැතිවරන මරන පරීක්ෂනයෙන්, නිදහස් වෙලඳ පොල ප්‍රතිසංස්කරන පිලිබඳ මොනම දෙගිඩියාවක් හෝ ඉවත ලා හෝක් හා කීටිං ආන්ඩු යටතේ ආරම්භ වූ ප්‍රතිපත්තීන් වැලඳගත යුතු බව නිගමනය කර තිබේ. හොවාඩ් ආන්ඩුවේ ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ගය කෙරෙහි සියලු විරෝධතාවන් අතහැරීම මගින් ලේබර් පක්ෂය දැනටමත් මේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා ඇත.

''ලේබර් ව්‍යාපාරයේ ආර්ථික අරමුනු හා නිත්‍යානුකූල භාවය'' සඳහා නව පදනමක් වෙනුවෙන් ලේබර් නායක මාර්ක් ලේතම් නොවැම්බර් 19 දින කථාවේ දී කැඳවුම් කලේ ය. ''කොන්ත්‍රාත්කරුවන්, උපදේශකයන්, හිමිකම් පවරාගන්නවුන්, හා ව්‍යවසායකයන්'' ගෙන් යුත් ''නව මධ්‍යම පන්තික'' හමුදාවක් ලෙස ඔහු හඳුන්වා දුන් කොටස් වෙත හැරීමක් තිබිය යුතුය. ''ජනතාව විශාල අනුක්‍රමාධිපති සංවිධානවලින් බිඳී නිදහස් විය යුතු අතර තමන්ගේම ආර්ථික අනාගතයේ ඒජන්තයන් බවට පත්විය යුතුය.''

සැබවින්ම කාරනය එහි ප්‍රතිවිරුද්ධය යි. අන්තර් ජාතික සංගත, බැංකු හා මූල්‍යායතනවල රූපය ගත්, තමන්ට කිසිදු පාලනයක් නොමැති ආර්ථික බලවේගයන් විසින් ලෝකය පුරා කම්කරුවන්ගේ ජීවිත මත පූර්න ආධිපත්‍ය පතුරුවා ඇති තත්වයක් මීන් පෙර කිසිදාක තිබී නැත. ලේතම්ට අනුව ''නව ව්‍යවසායකයන්'' ප්‍රාග්ධන ශ්‍රම සම්බන්ධතාවෙන් බිඳී නිදහස් වී ඇත්තේ ප්‍රමුඛ සංගතයන් වෙතින් නිකුත් කෙරෙන වියදම් කැපීමේ ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලය වසයෙන්ය. ධනවාදයේ ඉතිහාසය පුරාම සිදුවී ඇති ආකාරයට කම්කරු පන්තියේ සංයුතිය ඇත්ත වසයෙන් ම වෙනස් වී තිබේ. ලේතම්ගේ ඉදිරිදර්ශනයෙහි වැදගත්කම වන්නේ සමාජය යලි හැඩගැන්වීමේ කර්තව්‍ය පිලිබඳව කුමන සංකල්පයක් හෝ ඉන් බැහැර කර තිබීමයි. එක්සත් ජනපද ඩිමොක්‍රටිකයන් දෙවියන් වහන්සේ සොයායන්නේ නම් ඕස්ට්‍රේලියානු ලේබර්වාදීන් පුද්ගලයා පමනක් මිස සමාජයේ වෙනකිසිවක් නොමැත්තේ ය යන මාගරට් තැචර් හා ඇගේ දර්ශනවාදය සොයා යති.

## අඩු නපුර

ඕස්ට්‍රේලියාවේ දී මෙන්ම එක්සත් ජනපදයේදීත් මැතිවරන ව්‍යාපාරය තුල ''අඩු නපුර'' යන ශීර්ෂපාඨය යටතේ එක්රොක් වූ රැඩිකල් වාම පක්ෂ හා විරෝධතා කන්ඩායම්වලට ප්‍රතිවිරුද්ධව සමාජවාදී සමානතා පක්ෂය සිය මැදිහත්වීම ගෙනයනු ලැබීය. ඒ බුෂ් හෝ හොවාඩ් යලි පැමිනීම සැසඳීමේ දී, කෙරී හා ඩිමොක්‍රටිකයන්ගේ ද, ලේතම් හා ලේබර් පක්ෂයේ ද කුමන දෝෂ පැවතියේ වී නමුදු අවසන් විග්‍රහයේ දී ඔවුන් ''අඩුනපුර'' නියෝජනය කලේ ය යන්න මත ය. අප පැහැදිලි කලේ බලගතුම අන්තරාය වනුයේ බුෂ් හෝ හොවාඩ් යලි පැමිනීම නො ව කම්කරු පන්තිය තමන්ගේම ස්වාධීන ඉදිරිදර්ශනය හා ක්‍රියාමාර්ගය වර්ධනය කිරීමට අසමත්වීම බවයි. සැබවින්ම අපගේ විරුද්ධවාදීන් කියාපෑවේ තමන් ද කම්කරු පන්තියේ සමාජවාදී ව්‍යාපාරයක් වර්ධනය කිරීමට එකඟ බව ය. නමුත් අවධාරනය කලේ ක්ෂනික කර්තව්‍ය එය නො වන බව යි.

නිදසුනක් ලෙස තරික් අලි මහතාගේ ආස්ථානය ගෙන බලන්න. ඔහු ප්‍රකාශ කලේ ඉරාක යුද්ධයට

එරෙහි වන සියල්ලන් ප්‍රමුඛත්වය දියයුත්තේ කෙරී විසින් බුෂ් පරාජය කිරීමට බව යි. කාරනය එය නම් කෙරී යුද්ධයට සහාය දක්වූයේ හා එක්සත් ජනපද හමුදා යෙදවුම් වැඩි කිරීමට කතාකලේ කෙසේ දැයි තරික් අලි මහතා කිසිවිටෙක පැහැදිලි නො කලේ ය. ඔහුගේ යුක්තිකරනය වැරහැලි වී ගිය සියලු වර්ගවල අවසරවාදයෙන් අංගලක්ෂිත, දී ඇති කාරනාවන් වන්දනාමාන කිරීම විය.

විරුද්ධවාදීන්ට ප්‍රතිචාර දක්වමින් ඔහු මෙසේ ලිවීය. '''ඔබ කෙරීට ඡන්දය දෙන්ට යන්නේ ද? එසේ නම් ඔබ විකුනාගනියි' කියන මිනිසුන්ට මගේ ප්‍රතිචාරය වන්නේ ඔබ බුෂ් බලයේ සිටිය යුතු යයි බැරෑරුම්ව කියා සිටින්නේද? එය විකල්පය වන නිසා තෙවැනි පක්ෂයක් ඇත්තේ නැත. සමාජවාදී පක්ෂයේ ඉයුජින් ඩෙබ්ස් කෙනෙක් දශලක්ෂයක් ඡන්දය දිනාගෙන එහි ප්‍රතිඵලය වසයෙන් දසවසක් සිරකොට තබන්නේ ද නැත. ඔහු පෙනෙන්නටවත් නැත.''

එහෙත් අලි මහතා හා ඔහුගේ වර්ගයේ අනෙක් අය මෙසේ නොඅසයි. සමාජවාදී ව්‍යාපාරයක් නොමැත්තේ කුමක් නිසා ද? තරික් අලි හා ඔහුගේ පුරෝගාමීන් වැනි දේශපාලනඥයන් විසින් දිරිමත් කල කම්කරු පන්තිය ඩිමොක්‍රටික් පක්ෂයට දිගටම යටත් කොට තැබීම ඊට එක් හේතුවකි. හැමවිටම තර්කය වූයේඃ ඔව් අප සමාජවාදී ව්‍යාපාරයක් වර්ධනය කිරීමට එකඟ යඃ ඩිමොක්‍රටික් පක්ෂය සැබවින්ම ධනේශ්වර පක්ෂයකිඃ එහෙත් මේ දැන් තත්වය ඉල්ලා සිටින්නේ කම්කරු පන්තිය රිපබ්ලිකානුන් පරාජය කිරීමට ඒ පිටුපස රැලිවීම යඃ ඉන්පසුව පමනක් අපට දිගුකාලීන අරමුනු සලකා බැලිය හැකිය.

කෙසේ වුව ද කීමට ඇත්තේ මෙම මැතිවරනයේ දී අවස්ථාවාදීන්ට සිය පැරනි පිලිවෙත්වල ප්‍රතිවිපාකවලට මුහුන දීමට සිදුව ඇත. ඩිමොක්‍රටික් පක්ෂයට දශක ගනනාවක් තිස්සේ යටත්ව සිටීමෙන් ජනිත කල දේශපාලන ව්‍යාකුලත්වය කම්කරු පන්තියේ සැලකිය යුතු කොටස් රිපබ්ලිකානුවන්ගේ දක්ෂිනාංශික හොර බෙහෙත්වලටත් ''වටිනාකම්'' වලට කල ආයාචනයන්ටත් ගොදුරුවීමේ ප්‍රධාන හේතුව විය. වෙනත් වචනවලින් කිව හොත් කම්කරු පන්තිය තුල සමාජවාදී සවිඥානකත්වය වර්ධනය කිරීම, කම්කරු පන්තිය දේශපාලනිකව සන්නද්ධ කිරීම, ධනේශ්වර පක්ෂවලට එහි යටත්වීම අවසන් කිරීම, සඳහා සටන් වැදීම - අතෙහි ඇති ක්ෂනික කර්තව්‍යයන් හමුවේ ප්‍රායෝගික නො වේ යයි සලකනු ලබන - සියලු ප්‍රශ්න අතුරෙන් වඩාත්ම තීරනාත්මක හා ක්ෂනික දේ බවට පත්ව ඇති බව යි.

තවත් වාම රැඩිකල්වාදි තාරකාවක් වන බ්‍රිතාන්‍යයේ සමාජවාදී කම්කරු පක්ෂයේ අලෙක්ස් කොලිනිකෝස් මහතා වෙත හැරීමට මට ඉඩදෙන්න. ජන ගහනයේ අතිශයින්ම දුගී හා පීඩිත ජනතාවගේ කොටසක් රිපබ්ලිකානුවන්ට ඡන්දය දීමේ කාරනයට යොමුවෙමින් ඔහු අවධාරනය කලේ පිලිතුර වන්නේ ''කම්කරු පන්තියේ කෝපය, එහි දුක්ගැහැටවල මූලය වන, සිය අවශ්‍යතාවන් ක්‍රියාත්මක කරවීමට රිපබ්ලිකානුන් ද ඩිමොක්‍රටිකයන් ද යන දෙකොට්ඨාශයම මිලට ගෙන ඇති හා ඇමරිකානු සමාජයේ ආධිපත්‍යය දරන අති ධනවත් හා තුනී ව්‍යාපාරික පන්තියට එරෙහිව යොමුකරවන්නා වූ පන්ති දේශපලනය යි. මෙහි අර්ථය ප්‍රධාන පක්ෂ දෙකටම අව්‍යාජ විකල්පයක් වර්ධනය කිරීමට නිර්භීත උත්සාහයක් දරන රැල්ෆ් නාඩර් හා ඔහුගේ ආධාරකරුවන් සුලු කන්ඩායම මත පදනම් වීමයි. (*සෝෂලිස්ට් වර්කර්* - 2004 නොවැම්බර් 11)

නාඩර් හා ඔහුගේ ව්‍යාපාරයේ ද සමහරවිට ඔහු සන්ධාන ගතවන හරිතයන්ගේ ද අරමුන කම්කරු පන්තියේ ස්වාධීන අවශ්‍යතාවන් නියෝජනය කරන හා ඒ සඳහා සටන් වදින පක්ෂයක් ගොඩනැගීම නො වේ. ඒ වෙනුවට එය ඇත්තේ ඩිමොක්‍රටික් පක්ෂය වමට තල්ලු කිරීමට ය. නාඩර් ඩිමොක්‍රටික් පක්ෂයට විකල්පයක් නියෝජනය නොකරන අතර ඔහු ඒ තුල කම්කරු පන්තිය හිරකොට තැබීමේ දේශපාලන යාන්ත්‍රනයක කොටසක් වේ.

ඕස්ට්‍රේලියාවේ දී විරෝධතා ව්‍යාපාරයන්හි හොරනෑවක් වන *සෝෂලිස්ට් වර්කර්* පුවත් පත මැතිවරනය විස්තර කරන්නේ ''වමට අවදිවීම සඳහා කල කැඳවුමක්'' ලෙස ය. ඉරාක යුද්ධය හා සරනාගතයන් සම්බන්ධයෙන් හොවාඩ්ට අභියෝග කල ව්‍යාපාරයන් ගොඩනැගීම වෙනුවට එය විස්තර කලේ ''හොවාඩ්ට එරෙහිව තුලනය වෙනස් කිරීමට'' මෙය නොසෑහෙන බවයි. ''ඊට හේතුව යුද්ධයට හා වර්ගවාදයට එරෙහිව ගොඩනැගෙන ක්‍රියාකාරීන්ගේ ජාලයන්ට පුලුල් ජනගහනය තුල විශේෂයෙන්ම සංවිධිත කම්කරු ව්‍යාපාරය තුල, සැලකිය යුතු ගැඹුරු මූලයන් නොමැතිවීමයි.''

එහෙත් කේන්ද්‍රීය දේශපාලන ගැටලුව වන්නේ සංවිධිත කම්කරු ව්‍යාපාරයක් නොමැතිවීම යි. කම්කරු පක්ෂය හා වෘත්තීය සමිති තිබුන ද එම සංවිධාන පලල් කම්කරු ජනතාවගේ සමාජ අවශ්‍යතාවන් හා තත්වය වෙනුවෙන් පෙනීසිටීමේ දී එයට කිසිදු සම්බන්ධයක් නැත. කම්කරු ව්‍යාපාරයක් වෙනුවට ඇත්තේ නිලධාරිවාදී කෝම්බයකි. ගසක කඳෙහි ලැග සිටින රැහැයියෙකු මෙන්, කලෙක පැවති දෙයෙහි පෙනුම ප්‍රදර්ශනය කරමින් පිටතවැස්ම ඉතිරිව තිබුන ද ඇතුලත ද්‍රව්‍යයන් වියැකීගොස් ඇත. කර්තව්‍යය වන්නේ නොපවතින්නා වූ සංවිධිත කම්කරු ව්‍යාපාරයකට අන්තර්ග්‍රහනය වීම නො ව එවැන්නක් යලි ගොඩනැගීමයි. එහි අර්ථය පැවති කම්කරු

ව්‍යාපාරයේ ව්‍යුහය දිරාපත්ව බිඳී විසිර යෑමේ හේතු විභාග කිරීමෙන් අවශ්‍ය දේශපාලන නිගමන උපුටා ගැනීම යි.

## සමාජවාදී සංස්කෘතියක්

කම්කරු ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම සැමවිටම සමාජවාදී ක්‍රියාමාර්ගයකට හා ඉදිරිදර්ශනයකට සටන්වැදීම සමග බැඳී පැවතුනි. අද කේන්ද්‍රීය කර්තව්‍ය වන්නේ කම්කරු ව්‍යාපාරය සමාජවාදී සංස්කෘතියෙන් හා ආකල්ප යලි හඳුන්වාදීම තුලින් දේශපාලනිකව යලි උගන්වා ගැනීම යි. මෙම ඉදිරිදර්ශනය අන්තර්ගත කරගන්නේ කුමක් ද?

සියල්ලටම ප්‍රථමයෙන් කම්කරු පන්තිය පොරබදන ගැටලු සම්භවයෙන් ද විෂයපථයෙන් ද, භූගෝලීය වන බවත් ලෝක ජනතාව මුහුන දී සිටින කිසිදු ගැටලුවකට ජාතික ක්‍රියාමාර්ගයක පදනමේ විසඳුමක් සොයාගත නො හැකි බවත් හඳුනාගැනීම එයට සම්බන්ධ ය. කම්කරු ව්‍යාපාරයේ පුනර්ජීවනයෙහි ප්‍රථම හා ඉතා වැදගත් පියවර වන්නේ, මනුෂ්‍ය වර්ගයා මුහුන දී සිටින සියලු ගැටලුවල හදවතෙහිම පවතින්නේ, එම ජාතික රාජ්‍ය ව්‍යුහයන් ම බව අවබෝධ කර ගැනීම යි.

භූගෝලීය නිෂ්පාදන බලවේගයන් ප්‍රසාරනය වී ඇති පරිමාව කොතෙක් ද යත් තරඟකාරී ජාතික රාජ්‍යයන්ට බෙදී හා කැපී ගොස් ඇති ලෝකය තුල ඒවා තාර්කිකව ප්‍රයෝජනයට ගත නොහැකිව ඇත. විසඳුම වැටී ඇත්තේ අනෙකුන්ට ඉහලින් සිටින සුපිරි බලවතෙකුගේ ආධිපත්‍ය යටතේ ද නො වේ. නිෂ්පාදකයන්ගේ සහයෝගිතාව මගින්, යෝධ සංගත හා මූල්‍යායතනවල ලාභය සඳහා නො ව, මිනිසාගේ ඕනෑ එපාකම් සඳහා ප්‍රයෝජනවත් වන පරිදි, ජාත්‍යන්තර පරිමාවකින්, මිනිසාගේ නිෂ්පාදන බලවේග බුද්ධිමත්ව හා තර්කාන්විතව සංවර්ධනය භාරගත යුතු, මනුෂ්‍ය සමාජයේ ඓතිහාසික සංවර්ධනය එක් ලක්ෂ්‍යයකට ලඟා වී ඇත.

දෙවැනුව, තත්වය හොඳ අතට හැරේය යන බලාපොරොත්තුවෙන් හා ධනවාදය පිලිබඳ පරාජකවාදී පිලිගැනීම ඉක්මවා යෑමක් කම්කරු ව්‍යාපාරය යලි උගන්වා ගැනීම හා යලි සන්නද්ධ කිරීමේ දී අත්‍යවශ්‍ය ය. ජාත්‍යන්තර සාමජවාදී ක්‍රියාමාර්ගය සඳහා ද එයට පැවරී ඇති සියල්ල සඳහා අවශ්‍ය වන්නේ දේශපාලන අරගලයක් සංවර්ධනය කිරීම යි.

තෙවැනිව, මේ සඳහා කෙටි මාවත් නොමැති බව වටහා ගැනීම මත පදනම් වී ගත යුතු ය. සමාජවාදී ව්‍යාපාරයක නායකත්වය බවට වෙනත් යම් සංවිධානයක් පරිවර්තනය කල හැක්කා වූ දක්ෂ උපායාත්මක මූලිකත්වයක් පවා තිබිය නොහැක. අවලක්ෂන ගෙම්බෙක් කඩවසම් කුමාරයෙකු බවට පත්විය හැකි ය යන්න සුරංගනා කතාවක් මිස දේශපාලන ඉදිරිදර්ශනයක් නො වේ. එහෙත් එවන් කතන්දර විකුනා කන මිනිසුන් හා සංවිධාන නැතුවා නො වේ.

සමාජවාදී සන්ධානය එවන් එක් කන්ඩායමකි. මැතිවරන සමයේ දී ඔවුන්ගේ එක් ප්‍රමුඛ කර්තව්‍යයක් වූයේ ජනතා බලපෑමෙහි ශක්තිය හා හරිතයන් සතු බලය හමුවේ කම්කරු පන්තිය සඳහා අලුත් මාවතක් කෙටුම්පත් කල හැකි ය යන මායාව පැතිරවීම යි.

මැතිවරනය ආසන්නව පලකල කතුවැකියක් තුල, හොවාඩ්ගේ වැඩබිමෙහි සම්බන්ධතාවන් පිලිබඳ පනත වැනි පියවරයන්ට දැක්වූ විරෝධය හා ප්‍රජාතන්ත්‍රීය නිදහසෙහි ද මනුෂ්‍ය ශිෂ්ඨත්වයෙහි ද ආරක්ෂාව වෙනුවෙන් පෙනීසිටිමින් ආර්ථික හේතුවාදයට එරෙහිව නැගී සිටීම සම්බන්ධයෙන්, සමාජවාදී සන්ධානය හරිත පක්ෂ මන්ත්‍රීන් වර්නනා කලහ.

''එනමුදු හරිතයන් ඔවුන්ගේම බරපතල තීන්දුවලට මුහුන දෙනු ඇත. වහාම නො වේ නම් මග නො හැරිය හැකි ලෙස තීරනාත්මක මොහොත පැමිනි විට ඔවුන් සිය ජර්මානු සහකරුවන් අනුව යමින් ඔවුන්ගේ දකුනට බර රතු කොල සන්ධානයක් ගොඩනගයි ද? නැතහොත් ඔවුන්ගේ වමට බර ලේබර් පක්ෂ හවුලක් ගොඩනගයි ද?''

සැබවින් ම එය ඕස්ට්‍රේලියානු හරිතයන් සිය ජර්මානු සහකරුවන් අනුගමනය කිරීම පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. බොහෝ පැතිවලින් සිය ජාත්‍යන්තර සහකරුවන් සඳහා මාවත කෙටුම්පත් කලේ ඔවුන් ය. මැතිවරනය ප්‍රකාශයට පත් කල වහාම බොබ් බ්‍රවුන් ජාතික පුවත් පත් සන්සදය හමුවේ කල කථාවේ දී, සිය අසන්නන්ට 1980 ගනන් අගභාගයේ දී තස්මේනියාවේ හරිතයන් ලේබර් පක්ෂය සමග ගොඩනැගූ සන්ධානය ගැන සිහිපත් කලේ එය ප්‍රාන්ත ඉතිහාසයේ විශාලතම අයවැය කප්පාදුන් සමහරක් ක්‍රියාවට නගා තිබිය දී ය. එහිම පහල කොටස්වලින් ද, වඩා පුලුල් වසයෙන් ද පැනනැගි විරෝධතාවය මධ්‍යයේ හරිතයන් ''තත්වය පාලනය කරගත්'' බව බ්‍රවුන් සඩම්බරව කියා සිටියේ ය. මෙම ඉතිහාසය සාකච්ඡා කිරීමේ ඔහුගේ අරමුන වූයේ හරිතයන් එයම යලිත් කිරීමට ඕනෑවටත් වඩා සූදානම් බව පැහැදිලි කර දීම ය.

සමාජවාදී සන්ධානයට අනුව හරිතයන් අතර මූලධර්ම හතරක් සම්බන්ධයෙන් ''අවම කල නොහැකි විසංවාදයක්'' පවතියි. එනම් සමාජ යුක්තිය, සාමය, ප්‍රජාතන්ත්‍රවාදය හා පරිසර සමබරතාවය ද කොල්ලකාරී ධනවාදය ද වේ. ''මෙම විසංවාදය එක් හෝ තවත් මගකින් විසඳනු ඇත. ඉක්මනින් හෝ පසුව පොදුවේ පැතිර පවතින ධනේශ්වර විරෝධය ලාභ ක්‍රමයේ

නියෝගයන් හමුවේ එක්කෝ මිය යනු ඇත. නැතහොත් එය අරමුනක් ඇති දැනුවත් ධනේශ්වර විරෝධයක් බවට පත්වනු ඇත. එනම් එය වචනයෙන් නො ව ක්‍රියාවෙන් සමාජවාදය වනු ඇත.'' (වාම හරිත සතිපතා පුවත්පත. 2004 ඔක්තෝබර් 6)

''සමාජවාදය වචනයෙන් නො ව ක්‍රියාවෙන්'' යන වචන කිහිපය සියලු අවස්ථාවාදී ප්‍රවනතාවන්ගේ ආස්ථානය කැටි කර දක්වයි. ඔවුන් විශ්වාස කරන්නේ තමන්ට ඓතිහාසික ක්‍රියාවලිය කෙසේ හෝ කෙටි මඟක් ගැනීමෙන් රවටිය හැකි බවත් දැනුවත්ව සටන් වැදීමකින් තොරව සමාජවාදය අත්කරගත හැකි බවත් ය. සමාජවාදය වනාහි අඛන්ඩව සාකච්ඡා කල වාදවිවාද කල හා සටන්වැදි දේශපාලන ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලය වන තාක් දුරට වචනයෙන් නො ව ක්‍රියාවෙන් සමාජවාදයක් තිබිය නො හැකි ය. ජාත්‍යන්තර කම්කරු පන්තියේ මහජන ව්‍යාපාරයක ඉතා දැනුවත්ව සංවර්ධනය කල ක්‍රියාමාර්ගයක් ලෙස සමාජවාදය සංවර්ධනය විය යුතු ය. නැතහොත් එය කිසිසේත් ම වර්ධනය නොවනු ඇත. සැබවින්ම ධනේශ්වර විරෝධී මනෝභාවයන්හි ස්වයංසිද්ධ පුපුරායැම් දැනටත්, වැඩිවැඩියෙන් අනාගතයේ දීත්, ඇතිවිය හැකි වුවත්, මනෝභාවයක්, විරෝධතාවක් ඒවා පැනනගින්නේ කොතරම් සටන්කාමී රූපයකින් වුවත් ධනවාදය පෙරලා දැමීමට අසමත්වනු ඇත.

සියවසකටත් පෙර දී ෆ්‍රෙඩ්රික් එංගල්ස් මේ ප්‍රශ්නයම සාකච්ඡා කලේ ය. 1848 විප්ලයන්ගේ අසාර්ථකත්වයෙන් උපුටාගත් පාඩම් විශ්ලේෂනය කරමින් 1893 දී ඔහු පැහැදිලි කලේ ඉන් සනාථ කරනු ලැබ ඇත්තේ එම කාලය වසඟයට ගෙන තිබූ සංකල්පයන්හි තිබූ පරිපූර්න නොසැහුනු කම යි.

''නොදැනුවත් මහජනතාව මත නැගී සිටි දැනුවත් කුඩා සුලුතරයන් විසින් ගෙනගිය විප්ලවයන්ගේ හදිසි ප්‍රහාරයන්හි කාලය ඉකුත් වී ඇත. සිතින් හා කයින් යන දෙකෙන්ම තමන් ගමන්ගන්නේ කුමක් සඳහා ද, පරදුවට තැබී ඇත්තේ කුමක් දැයි දැනට මත් තමන් විසින් අවබෝධ කරගත්තා වූ ද, මහජනතාව ද ඇතුලත්ව සිටින්නා වූ සමාජ සංවිධානයේ පරිපූර්න පරිවර්තනයක් පිලිබඳ ප්‍රශ්නයක් බවට එය පත්ව තිබේ. පසුගිය අඩසියවසක කාලය අපට මේ දෙය උගන්වා තිබේ. එහෙත් එය ක්‍රමානුකූල වන්නේ මහජනතාව දිගු නිරන්තරව වැඩ කිරීම අවශ්‍ය වන, තමන් කලයුත්තේ කුමක් දැයි අවබෝධ කර ගත් විට දී ය. අප දැන් යෙදීගෙන සිටින්නේ හරියටම මේ කටයුත්තෙහි ය.

## එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ පිරිහීම

එහෙත් ඉදිරිදර්ශනය කෙතරම් යථාර්ථවත් ද යන ප්‍රශ්නය පැනනගියි. එක්සත් ජනපදයේ ලෝක ආධිපත්‍යය සමාජවාදය සාක්ෂාත් කර ගැනීම නො කල හැක්කක් බවට පත්කර නොමැත්තේ ද? සෝවියට් සංගමයේ බිඳවැටීමෙහි ඓතිහාසික වැදගත්කම එය නොවේ ද?

එවක දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව කල විශ්ලේෂනය අප සිහියට නගාගනිමු. අප අවධාරනය කලේ සෝවියට් සංගමයේ බිඳවැටීම සමාජවාදයේ අවසානය හෝ ධනවාදයේ විජයග්‍රහනය නො ව, පශ්චාත් යුධකාලීන ආර්ථික හා දේශපාලන සැකැස්මෙහි කඩාවැටීම හා ලෝක ධනවාදයේ කේන්ද්‍රීය පරස්පරවිරෝධය, එනම් නිෂ්පාදන බලවේගයන්ගේ භූගෝලීය සංවර්ධනය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර පවත්නා ප්‍රතිවිරෝධය, පුපුරායාම බව යි.

පසුගිය සියවස් එකහමාර පුරා එක්සත් ජනපදය එන්ටඑන්ටම මිලිටරිවාදය කරා නැඹුරුවීම - මෙම ක්‍රියාවලිය ආරම්භ වූයේ ජෝර්ජ් ඩබ්. බුෂ් පරිපාලනය සමග නො වේ - නියෝජනය කරන්නේ අනෙකුත් සියල්ලට ඉහලින් සුපිරි ජාතික රාජ්‍ය ලෙස එක්සත් ජනපදය පිහිටුවීම මගින් ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවේගය විසින් මෙම පරස්පරවිරෝධය තමන්ගේ ම අවශ්‍යතාවන්හි පදනමේ විසඳීමට දරන මංමුලාසහගත උත්සාහය යි. එය සක්‍ය ඉදිරිදර්ශනයක් ද? ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවතා වන එක්සත් ජනපදයට ලෝකය මත කිසියම් සම්මුතියක් (පැක්ස් ඇමරිකානා) ඇතිකල හැකි ද? එසේ නම් එය පෙරලා දැමීමේ කිසිදු අපේක්ෂාවක් ශක්‍ය නො වන බව අප නිගමනය කල යුතු ය. නො එසේ නම් එවන් උත්සාහයක් පවත්නා ධනේශ්වර සැකැස්ම ම ප්‍රශ්නයට බඳුන් කරන දේශපාලන හා සමාජ පෙරලිකාරිත්වයක් නිර්මානය කරනු ලබයි ද? කාරනා පවතින්නේ එලෙසින් ය.

ප්‍රථමයෙන් අප මිලිටරි තත්වය පරීක්ෂා කර බලමු. *ෆොරින් එෆෙයාර්ස් සඟරාවේ* මෑත කලාපයේ පල වූ ලිපියක එක්සත් ජනපද පාලක කවයන්හි විශාල කොටසකගේ චින්තනය කැටිකොට දක්වයි. ඉරාක ආක්‍රමනයෙන් 18 මසකට පසුව එක්සත් ජනපදය නීතියුක්ත භාවයේ බැරෑරුම් ගැටලුවකට මුහුන පා සිටින බව කතුවරුන් නිගමනය කරති. භූගෝලීය දේශපාලන සැකැස්මෙහි ස්ථාවරත්වය පවත්වා ගැනීමේ වගකීම එක්සත් ජනපදය විසින් බාරගත් දෙවැනි ලෝක යුද්ධාවසානයේ පැවතියාට වඩා මෙය බෙහෙවින් වෙනස් තත්වයකි. ''නීතියුක්තභාවය අහිමිවීමේ තැතිගැන්මකට'' එක්සත් ජනපදය මුහුන පා සිටින බව ඔවුන් පෙන්වා දෙති.

''සැප්තැම්බර් 11 ප්‍රහාරයන්ට පෙර සිටම බුෂ් පරිපාලනය ජාත්‍යන්තර නීතිය කෙරෙහි ගැඹුරු සංශයවාදයක් ප්‍රකට කලේ ය. එක්සත් ජනපදයේ

අවිපාලනය හා ජාත්‍යන්තර ආරක්ෂාව පිලිබඳ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් ජෝන් බෝල්ටන් 1990 ගනන් අවසන් කාලයේ මෙසේ ප්‍රකාශ කලේ ය. ''අපගේ කෙටිකාලීන අවශ්‍යතාවන් වෙනුවෙන් එසේ කල යුතු බව පෙනීගියේ වී නමුදු ජාත්‍යන්තර නීතියට යම් හෝ වලංගු භාවයක් ප්‍රදානය කිරීම අප කරන බරපතල වැරැද්දකි. මක්නිසාද යත් දිගුකාලීනව ජාත්‍යන්තර නීතිය සැබවින්ම යම් අර්ථභාරයක් දරන්නේ යයි සිතන අයගේ අරමුන එක්සත් ජනපදයට අවහිර පැමිනවීම යි. මෙම තර්කනය පූර්වයෙන් එක්සත් ජනපදය නීතියුක්ත භාවය ගැබ් කොට ගත්තා වූ මූලධර්ම කෙරෙහි මූලිකව සතුරු ආකල්පයක් දරා සිටියි. එහෙත් සැප්තැම්බර් 11 පෙර පැවති මඳ සුලඟ ඉක්මනින්ම පූර්න ටොනාඩෝ කුනාටුවක් බවට පත්වූයේ ප්‍රහාරයන් කෙරෙහි බුෂ්ගේ ප්‍රතිචාරය එලිමහනට ඒමත් සමග ය.

''වොෂින්ටනය නීත්‍යානුකූලභාවයට එහි කැපවීම මගින් නීතිවිරෝධී ක්‍රියාමාර්ගයන් යුක්තිසහගත කිරීම වැඩි වසයෙන් නො වේ නම් සුලබ වසයෙන් සිදු කරන බව නිර්නය කරන ලෝක මහජන මතය එක්සත් ජනපදය සේදී යන තත්වයකට ලඟා වී තිබෙන බව පැහැදිලි වේ යයි පහසුවෙන්ම නිගමනය කරයි. වසර ගනනාවක් පුරා වාග් ප්‍රහාරයන් මගින් ද සමහරවිට ප්‍රයෝගිකව ද ''දඩබ්බර ජාතීන්''ට එරෙහිව සටන් වැදි එක්සත් ජනපදය එසේ උපකල්පනය කරයි. එක්සත් ජනපදය සතු බලයේ නීතියුක්ත භාවය දැඩි ලෙස බාදනයට ලක්ව ඇති අතර සමහර අවස්ථාවන්හි දී නිදසුනක් ලෙස ඉරාකයේ පුලුල් ලෙස සිදු වූ වධදීම් සම්බන්ධ පල වූ වාර්තාවන්ට පොදු පිලිකුල වැනි තත්වයන්හි දී එය මුලුමනින්ම අතුරුදහන්ව ඇති බව පෙනේ.''

කතුවරුන්ට අනුව, ආපසු වැටී ඇත්තේ පහසු මඟක් නො වේ. එය නිත්‍යානුකූල පැවැත්මක් කරා ආපසු යෑමට සම්බන්ධ ය. එහෙත් මෙය, ප්‍රථම වතාවේ දී ම නීත්‍යානුකූල පැවැත්ම අතහැර දැමුවේ මන්ද යන ප්‍රශ්නය සරල බව මතුකරයි. මෙය දෙවැනි ලෝක යුද්ධාවසානයේ පිහිටුවාගත් පැරනි රාමුව තුල එක්සත් ජනපදයට සිය තත්වය පවත්වාගත නො හැකි ය. යන කාරනයේ ප්‍රකාශනයක් නො වේ ද?

එක්සත් ජනපදයේ ජාත්‍යන්තර තත්වය පිලිබඳ කනස්සල්ල පෙන්ටගනය තුලින් මත් දැකගත හැකි ය. පසුගිය සැප්තැම්බරයේ දී ආරක්ෂක විද්‍යා මන්ඩලය විසින් ''මූලෝපායික සන්නිවේදනයන්'' නමින් පිලියෙල කල එහෙත් දැන් ප්‍රසිද්ධ කර තිබෙන වාර්තාව ''අදහස් සඳහා යුද්ධය හෝ හද හා සිත දිනාගැනීමේ අරගලය'' තුල දී ඇමරිකානු උත්සාහය ''අසාර්ථක වී ඇතුවා පමනක් නො ව අත්කරගෙන ඇත්තේ ද ඔවුන් අපේක්ෂා කල දේහි අනෙක් පැත්ත ය'' යනුවෙන් සඳහන් කරයි.

එක්සත් ජනපදය වේගයෙන් පරාජය වන ''අදහස් සඳහා වු භූගෝලීය හා පාරම්පරික අරගලයක'' යෙදී සිටින අතර ''ලෝක පරිමාන නොසතුට හා කෝපය ඇමරිකාවේ කෙලෙසී ඇති ප්‍රතිරූපය කෙරෙහි ද එය සිය අරමුනු ඉටුකරගන්නා වූ ක්‍රමය කෙරෙහි ද යොමු වී ඇත. ඒත්තු ගැන්වීමේ ඇමරිකානු බලය අර්බුදකාරී තත්වයක පවතින බවට පොදු එකඟතාවක් පවතී.'' මෙම වාර්තාවේ කතුවරුන්ගේ කනස්සල්ල මතුවන්නේ ලෝකාධිපත්‍ය ක්‍රියාත්මක කිරීමට මිලිටරි ශක්තිය පමනක් ම නොසෑහෙන බව ඔවුන්ගේ දේශපාලන හාම්පුතුන් අවබෝධ කර නො ගත්ත ද අවම වසයෙන් ඔවුන් එය අවබෝධ කරගෙන තිබීමේ කාරනයෙනි.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය බාහිර ගැටුම්වලින් හා ප්‍රතිවිරෝධයන්ගෙන් කොටු කර තිබෙන්නා සේ ම අභ්‍යන්තර තත්වය ද සතුටුදායක නැත. දේශපාලනිකව ජනගහනය ගැඹුරෙන් ම බෙදී ඇත. පාලන තන්ත්‍රය ආගමික ප්‍රතිගාමීත්වයේ ද අගතීන්ගේ ද, බියපත්කමේ ද සංකලනයක් තුල තෙමේ ම හිර වී සිටියි. ඒ සමග ම එහි විරුද්ධවාදීන් අතර කෝපය, අපේක්ෂාභංගය, අතෘප්තිය හා මංමුලාව පැතිර පවතියි. මැතිවරන ප්‍රතිඵලයම, වැඩෙන ජන සංඛ්‍යාවක් ඉදිරියේ තමන්ගේ ම දේශපාලන සංකල්පයන් බැරෑරුම්ව විභාග කිරීමට යොමුවීමක් හා දේශාපලන විකල්පයන් සෙවීම අරඹන තත්වයක් ද මුනගස්වා ඇත.

ආර්ථික තත්වය අවසාන එහෙත් අවම සාධකය නො වේ. තමා භූගෝලීය අධිපතියා බවට පත්වීම මගින් ලෝක ධනවාදී ක්‍රමයේ ප්‍රතිවිරෝධයන් විසඳීමෙහි එක්සත් ජනපද අධිරාජ්‍යවාදය යෙදී සිටියි. එහෙත් එය මෙම කර්තව්‍ය බාරගෙන ඇතතේ ප්‍රගාඪ ආර්ථික දුබලතාවයක් හමුවෙහි ය. එක්සත් ජනපද මූල්‍ය ක්‍රමය රඳා පවතින්නේ සෑම වැඩ කරන දිනක ම අවම වසයෙන් රට තුලට ගලා එන ඩොලර් බිලියන 2.6ක් මත ය. සෝවියට් සංගමය බිඳ වැටුනු 1980 ගනන් අවසානය වන විටත් එක්සත් ජනපදය නය හිමි ජාතියක් විය. අද එය ලෝකයේ විශාල තම නයගැතියා ය. එහි මූල්‍ය පාවීම තබාගැනීම පිනිස ලෝක ගෙවුම්ශේෂ අතිරික්තයෙන් හතරෙන් තුනක් පමන යලිත් එක්සත් ජනපදය තුලට හරවා එවනු ලැබිය යුතු ය. පශ්චාත් යුද්ධ එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨත්වය පිහිටුවනු ලැබුවේ එය සතු මූල්‍ය ක්‍රමය හා විශිෂ්ඨ නිෂ්පාදන ක්‍රමයන්හි පදනම මත ය. අද දින, එක්සත් ජනපද මූල්‍යය රඳා පවත්නේ එක්සත් ජනපද මුදල කඩා වැටීම පොලී අනුපාතිකයන් ඉහල නැගීම වැලැක්වීමට ආසියානු මධ්‍යම බැංකු විශාල ඩොලර් වත්කම් මිලට ගැනීම මත ය.

රෝම අධිරාජ්‍යය බිඳවැටුනේ බාහිර ගැටුම් නිසා ද ඉහල නැගි ආර්ථික ගැටලු නිසා ද නැත්නම් රෝමය තුලම හටගත් සමාජ හා පන්ති ගැටුම් වැඩී යාම නිසා

ද යන්න ගැන පසුගිය දෙසිය වසර තුල ඉතිහාසඥයන් වාද විවාද කර ඇත. එක්සත් ජනපදය පිලිබඳ කාරනයේ දී මේ සියලු ක්‍රියාවලීන් භූගෝලීය අධිරාජ්‍ය පිහිටුවීමටත් පෙර ම ආරම්භ වී තිබේ.

විවිධ රැඩිකල්වාදී ප්‍රවනතාවන් භූගෝලීය ක්‍රියාවලීන් විස්තර කර ඇත්තේ එක්සත් ජනපදය විසින් අවශේෂ ලෝකය මත සිය පාලනය පැටවීමට සැලසුම් කිරීමේ ප්‍රතිවිපාක ලෙසිනි. සැබවින්ම මෙම ක්‍රියාවලීන් එක්සත් ජනපදයේ බලයට ජාත්‍යන්තරව ම වලකපා රට තුල දැවැන්ත සමාජ අසමානතාවයේ වර්ධනයට තුඩු දී ඇත. වෙනත් වචනවලින් කිව හොත් ලෝකය අලලා ගත් සමාජ හා දේශපාලන ගැටුම් ඒවායේ තීව්‍රතම ප්‍රකාශනය අත්කරගන්නේ එක්සත් ජනපදය තුලම ය.

අවසන් විග්‍රහයේ දී 20 වැනි සියවස පුරා ම ධනේශ්වර පර්යාය දරා සිටියා වූ එක්සත් ජනපදයෙහි ආර්ථික බලයට යටින් වලකැපීම ප්‍රගාඪ ඓතිහාසික වැදගත්කමක් දරයි. තවදුරටත් එසේ නො වේ. සූදානම් වීම අවශ්‍ය කෙරෙන විප්ලවවාදී අරගලයන්ගේ නව අවධියක් විවෘත වී තිබේ. ජාත්‍යන්තර ක්‍රියාවලියක පිලිබිඹුවක් වන්නා වූ එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියානු මැතිවරන හෙලි කර ඇත්තේ දේශපාලන බෙදුම්කඩනයන් පවතිනුයේ ප්‍රධාන පක්ෂ අතර නො ව නිල දේශපාලන සංස්ථාපිතය හා ජනගහනයේ ජන සමූහය අතර බව ය. එලඹෙන අවධියේ දී විප්ලවවාදී සමාජවාදී විකල්පයක් ගොඩනැංවීමේ වැඩ කටයුතු ඉදිරියට ගෙනයෑමට සැපයෙන අවස්ථාවන්ගෙන් දේශපාලන තත්වය හිඟ නො වනු ඇත.

© www.wsws.org